ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES TRADE UNION

அனைத்து இலங்கை சமுர்த்தி மேம்பாடு (வங்கிகள் நிறுவனங்கள் மற்றும் அலுவலகங்கள்) அதிகாரிகள் சங்கம்

ලි:ප:අංකය 7570 - නිල වෙබ් ලිපිනය - www.oisbku.com

අංක , 68 දෙහිදෙනිය ,පේරාදෙනිය

எண் 68, டெஹிடேனியா, பெரடெனியா

2022.01.25

එම නිසා සමෘද්ධි සංවර්ධන නිළධාරී සහෝදරය/සහෝදරිය!

අප විසින් ඔවුනට අපගේ ගැටළු විසදීමට ලබාදුන් කාලය හොදටෝම ප්‍රමාණවත් බව අප සංගමයේ අදහසයි.එම නිසා ඉදිරි සතිදෙක ඇතුලත සාධාරණ විසදුමක් මේ සදහා නොලැබුණහොත් විවිධවූ වෘත්තීය ක්‍රියාමාර්ග වලට අනතිරණය වීමට සිදුවන බව අප විධායක කමිටුව තීරණය කර ඇත.ඒ සඳහා ඔබ සැමට මෙයින් ආරාධනා කර සිටිමු.

එසේම මේවන විට අප දෙපාර්තමේන්තුවට අදාල වෘත්තීය සමිති ගණනාවක් එකතුව ඒකාබද්ධ සංවිධානයක් ලෙස කටයුතු කරමින් යන බව ප්‍රකාශකර ඇත.අප සංගමය එයට මේ දක්වා සම්බන්ධ වී නැත්තේ ඇයිදැයි ඔබට ගැටළුවක් මතුව ඇතැයි සිතමු.මීට පෙරද මෙම ගැටළු පදනම් කරගෙන ඒකාබද්ධ සංවිධාන මඟින් කටයුතු කළ බව ඔබට සිහිපත් කරමු.එසේ වුවද යම් පිරිසකගේ ප්‍රධාන ගැටළු වලට පිළිතුරු ලැබීමත් සමඟ ඒ හා සම්බන්ධව සිටි සහෝදර අනෙකුත් නිළධාරීන්ගේ ගැටළු අමතකකර එම එකමුතුව විනාශ කළබව ඔබට මෙයින් සිහිපත් කරමි.එසේ අපව පාවාදෙන අයවළුන් සමඟ එකතු වෙමින් අප සාමාජිකයින් අමාරුවේ දැමීමට අප සංගමය සූදානම් නොමැතිබව මෙයින් ප්‍රකාශකර සිටිමු.නමුත් ඔවුන් ද ගෙනයන පොදු වෘත්තීය අරගලයන් වලදී අප සංගමයේ පූර්ණ සහයෝගය ලබාදෙන බවද මෙයින් අවධාරණය කර සිටිමු.

එසේම අප සංගමය ඉදිරියේදී ගනු ලබන වෘත්තීය ක්‍රියාමාර්ග සාර්ථක කරගනිමින් අපගේ අයිතිවාසිකම් දිනාගැනීම සඳහා ඔබ කළාප මට්ටමින් , කොට්ඨාශ මට්ටමින් , දිස්ත්‍රික් මට්ටමින් සංවිධාන ගතවන ලෙසට මෙයින් ඔබව දැනුවත් කරමු.එසේම අප විසින් ඉදිරියේදී ගනුලබන තීන්දු තීරණ සියල්ල ඉතා කඩිනමින් ඔබවෙත දන්වා සිටින බවද මෙයින් දැනුම් දෙන්නෙමු.ඒ සඳහා ඔබගේ සක්‍රිය දායකත්වය ලබාදීමට කටයුතු කරණු ඇතැයි අප සංගමය විශ්වාස කරමු.

ප්‍රධාන සභාපති
සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන
(බැංකු මහා සංගම් හා කාර්යාල නිලධාරී සංගමය)
අංක 68 , දෙහිදෙනිය , පේරාදෙනිය

සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන
(බැංකු මහා සංගම් හා කාර්යාල නිලධාරී සංගමය)
අංක 68 , දෙහිදෙනිය , පේරාදෙනිය

පිටපත් :-

01.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති තුමන් කා : දැ : පි :

02.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය තුමන් කා : දැ : පි :

03.ගරු මුදල් අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමා කා : දැ : පි :

04.ගරු සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය,ස්වයං රැකියා හා
ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මැතිතුමා කා:දැ:ගැ:හා අ:ක:ස:

05.ගරු සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය,ස්වයං රැකියා හා
ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් තුමන් කා:දැ:ගැ:හා අ:ක:ස:

සභාපති
එන්.ඒ.එම්.අයි.බී.අබේසිංහ
දු:අං: 017-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු:අං:071-4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ඒ.වී.බස්නායක
දු:අං: 071-8191473

සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල)නිළධාරි සංගමය
ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES TRADE UNION
அனைத்து இலங்கை சமுர்த்தி மேம்பாடு (வங்கிகள் நிறுவனங்கள் மற்றும் அலுவலகங்கள்) அதிகாரிகள் சங்கம்

ලි:ප:අංකය 7570 - නිළ වෙබ් ලිපිනය - www.oisbku.com
අංක , 68 දෙහිදෙනිය ,පේරාදෙනිය
எண் 68, டெஹிடேனியா, பெரடெனியா

2022.01.25

**<u>සමෘද්ධි සේවක ගැටළු විසදීම සඳහා 2022.02.01 දින පැවති සාකච්ඡාවට අනුව සංගමයේ තීරණ දැනුම් දීම</u>**

සමෘද්ධි බැංකු,බැංකු සමිති,කාර්යාලගත හා ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිළධාරී සහෝදරය/සහෝදරිය.

අප නිළධාරීන්ට බලපාන මූලික ගැටළු විසදා ගැනීම සඳහා ගරු රාජ්‍ය අමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ ලේකම් හා කාර්යමණ්ඩලයේද සමෘද්ධි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තුමන් ඇතුළු කාර්යමණ්ඩලයේ සහභාගීත්වයෙන් සමස්ථ ලංකා සමෘද්ධි සංවර්ධන( බැංකු මහ සංගම් කාර්යාල හා ක්ෂේත්‍ර ) නිළධාරී සංගමය සමඟ 2022.02.01 දින සාකච්ඡාවක් පවත්වන ලදී.එහිදී අප සංගමය සමෘද්ධි නිළධාරීන්ට සෘජුවම බලපාන ගැටළු 19 ක් යටතේ සාකච්ජා කරණ ලදී.නමුත් අප නිළධාරීන්ගේ ගැටළු විසදීම වෙනුවට අළුතෙන් ගැටළු නිර්මාණය වන ආකාරයට දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටින බව පැහැදිලිවේ.

02.එම නිසා අප සංගමයේ විධායක කමිටුව පහත සඳහන් ගැටළු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරණ බව ඔබවෙත මෙයින් ප්‍රකාශකර සිටිමු.

- සමස්ත දෙපාර්තමේන්තු ක්‍රියාවලියම අප දෙපාර්තමේන්තුව තුලින් සිදුවන ආකාරයට සමෘද්ධි පනත බලාත්මක කොට සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ට ලබාදී ඇති නාමික තනතුරු ස්ථාවර කිරීම සිදුකළයුතු බවට.
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල සේවා සංයුතිය ඉතා කඩිනමින් අනුමත කරගතයුතු බවට.
- සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සඳහා MN-3 වැටුප් කාණ්ඩය ලබාදිය යුතු බවට.
- බැංකු,බැංකු සමිති හා කාර්යාල සේවකයන් සඳහා නීතිපති උපදෙස් අනුව ඔවුන්ගේ රාජකාරියට අදාල පත්වීම් ලිපි ලබා දියයුතු බවට,
- නව ගැටළු නිර්මාණය කරමින් බැංකු වලට හා කාර්යාල වලට නව උපාධිධාරී සංවර්ධන නිළධාරීන් අනුයුක්ත කිරීම හා රාජකාරී පැවරීම වහාම නවතා දැමියයුතු බවට.
- අප දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් වෙනත් ආයතන ප්‍රධානීන් විසින් රාජකාරී පැවරීම හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම වහාම නවතා දැමියයුතු බවට.
- සියළුම නිළධාරීන්ගේ පත්වීම් ලිපි හා වැටුප් ගැටළු ඉතා කඩිනමින් විසදිය යුතු බවට.
- 2017 වර්ෂයේ බඳවාගන්නා ලද සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ගේ පරිවාසකාලයෙන් පසුව සේවය ස්ථිර කිරීම ඉතා කඩිනමින අවසන් කළ යුතු බවට.

ඉහත සඳහන් කරුණු කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් 2022.02.01 දින සාකච්ඡාවේදී යොමුකළ අතර අමාත්‍යාංශය,ඇතැම් කොමිෂන් සභා හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මෙම ගැටළු ඉතා කඩිනමින් විසදියයුතු බවට ප්‍රකාශ කළ අතර ඒ සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම,කළමණාකරණසේවා දෙපාර්තමේන්තුව ආදී ආයතන සමඟ සාකච්ජා කරමින් පවතින බවත් ඒ සඳහා ඉදිරියට කෙටි කාලයක් ලබාදෙන ලෙසත් ඉල්ලීමක් කරණ ලදී.මෙවැනි ඉල්ලීම් සහ කැපකිරීම් 2014 අවුරුද්දේ සිට සිදුකළ අතර අප විසින් සිදුකළ එම කැපකිරීම් වලට කිසිදු සාධාරණත්වයක් මේ දක්වා සිදුවී නොමැත.අපගේ ඉල්ලීම් වලට බාලගිරි දෝෂය බලපා ඇති බව මෙයින් මනාව පසක් වේ.

| සභාපති | භාණ්ඩාගාරික | ප්‍රධාන ලේකම් |
| --- | --- | --- |
| එච්.ඒ.එම්.අයි.බී.අබේසිංහ | ආර්.ඩී.කේ.සේනාධීර | බී.එම්.ඒ.වී.බස්නායක |
| දු:අං: 017-2268463 | දු:අං:071-4395535 | දු:අං: 071-8191473 |